*සැ. යු.*– 2007.09.21 දින පළවූ අංක 1,516 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,517- 2007 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා - 2007.09.28**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 888 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 890 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 891 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 893 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 397

D/22/NY/379.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත.

කොමදෝරු ධම්මික සමරවික්‍රම, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ආර්එක්ස් 0083 - ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09-1051

---

2007 අංක 398

D/RF/824/NY/01/06.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2007 මාර්තු මස 18 වන දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ)) තුවාන් ප්‍රෂාන් මාසෝ එන්ආර්එස් 0909 ශ්‍රීලංනාහ

*2007 මාර්තු මස 25 දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්* :

ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) නිමල් රණසිංහ එන්ආර්එක්ස් 0910, ශ්‍රීලංනාහ
ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) පට්ටිය ගම්රාලලාගේ ජානක චන්ද්‍රලාල් සමරනායක, එන්ආර්එක්ස් 0911, ශ්‍රීලංනාහ
ලුතිනන් (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්) අත්බන්ධනගේ ඉන්දික ප්‍රියන්ත ද සිල්වා එන් ආර් එක්ස් 0914, ශ්‍රීලංනාහ

*2007 මාර්තු මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන්* :

ලුතිනන් (වියාබ) (තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ)) සම්පතාවඩුගේ නිහාල් කුමුදු සිල්වා, එන්ආර්ඉසෙඩ්, 0915 ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ.

09-1050

---

2007 අංක 399

D/RF/824/NY/01/06.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 ජනවාරි මස 10 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන්* :

ලුතිනන් (නාසෙ) නාගසිංහ ආරච්චිගේ ලලිත් නිශාන්ත, එන්ආර්පී 0996, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ දී ය.

09-1056

---

2007 අංක 400

D/RF/824/NY/01/06.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 ජනවාරි මස 12 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්* :

ලුතිනන් පල්ලගේ ශානක ඉමේන්ද්‍ර පෙරේරා ජයතිලක, එන්ආර්එක්ස් 1213 ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

09-1057

---

2007 අංක 401

D/RF/824/NY/01/06.

### ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 මාර්තු මස 02 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන්* :

ලුතිනන් උදේනි ප්‍රසාද් කුමාර විතානගේ, එන්ආර්එක්ස් 1221, ශ්‍රීලංනාහ
ලුතිනන් පුල්ලිආරච්චිගේ තිලක් තුෂාර ප්‍රනාන්දු, එන්ආර්එක්ස් 1224, ශ්‍රීලංනාහ
ලුතිනන් හිද්දදුර රංග දයාල් ද සොයිසා, එන්ආර්එක්ස් 1227, ශ්‍රීලංනාහ
ලුතිනන් මාගවත්තගෙ සමන්ත දිල්හාන් පෙරේරා, එන්ආර්එක්ස් 1229 ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

09-1055

---

2007 අංක 402

D/RF/824/NY/1/6.

### ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2007 මාර්තු මස 23 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) රංනුල සංජීව ලිවේරා කරුණාරත්න එන්ආර්එස් 1211, ශ්‍රීලංනාහ

*2007 අප්‍රේල් මස 06 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) හිරාන් රවින්ද්‍ර බණ්ඩාර තල්වත්ත එන්ආර්එස් 1226, ශ්‍රීලංනාහ

*2007 අප්‍රේල් මස 29 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) බඹරුන්දගේ දොන් තුෂාර ප්‍රියංක පෙරේරා එන්ආර්එස් 1198, ශ්‍රීලංනාහ
ලුතිනන් (සැ) ගොඩකන්ද ආරච්චිගේ ජීවන්ත විජේසුන්දර එන්ආර්එස් 1201, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

09-1054

---

2007 අංක 403

D/RF/824/NY/01/06.

### ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 අප්‍රේල් මස 24 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන්* :

ලුතිනන් (නාසෙ) වානයලැ සුනිල් ප්‍රේමරත්න, එන්ආර්පී 1030 ශ්‍රීලංනාහ

*2007 අප්‍රේල් මස 30 දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන්* :

ලුතිනන් (වියාබ) වික්‍රමසිංහ මුදියන්සේලාගේ නිශ්ශංක වික්‍රමසිංහ එන්ආර්ඉසෙඩ් 1123, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-1052

---

2007 අංක 404

D/RF/824/NY/01/06.

### ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2007 මැයි මස 13 වන දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන්* :

ලුතිනන් (සැ) ගෝනදුවගේ දොන් සුසිල් ඇන්තනී ප්‍රියන්ත පෙරේරා එන්ආර්එස් 1196, ශ්‍රීලංනාහ

ලුතිනන් (සැ) මහ ආරච්චිලාගේ රංජිත් ජයවර්ධන එන්ආර්එස් 1197 ශ්‍රීලංනාහ

ලුතිනන් (සැ) තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර තෙන්නකෝන් එන්ආර්එස් 1199, ශ්‍රීලංනාහ

ලුතිනන් (සැ) කනත්ත කංකානමලාගේ ලාස් වීරසිංහ, එන්ආර්එස් 1200, ශ්‍රීලංනාහ

ලුතිනන් (සැ) විජේරත්න සේපාල දහනායක, එන්ආර්එස් 1202, ශ්‍රීලංනාහ

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-1053

---

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 405

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ, එන්. ජී. දයාරත්න මහතා 2007 ජනවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-949

---

2007 අංක 406

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ, ආචාර්ය බී. එම්. එස්. බටගොඩ මහතා 2007 ජනවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම් හා පසු විපරම්) වශයෙන්.

09-950

---

2007 අංක 407

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ, එම්. බී. ඒකනායක මහත්මිය 2007 ජනවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-951

---

2007 අංක 408

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ, පී. ඒ. අබේසේකර මහතා 2007 ජනවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-952

---

2007 අංක 409

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ, ඩී. විදානගමාච්චි මහතා 2007 ජනවාරි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-953

---

2007 අංක 410

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ, ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහත්මිය 2007 ජනවාරි මස 16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-954

---

2007 අංක 411

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවය I වන පන්තියේ, කේ. එච්. අයි. ජයසිංහ මහත්මිය 2007 ජනවාරි මස 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

09-1101/2

---

2007 අංක 412

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :-

ශ්‍රී ලංකා පරිපාලන සේවය I වන පන්තියේ, ඒ. ආර්. ගුණවර්ධන මහතා 2007 ජූලි මස 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

09-1101/1

# ආණ්ඩුවේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව.

2007 සැප්තැම්බර් මස 06 වැනි දින,
අංක 428/11, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම් පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 40632 | හොරවල විතානගේ දිමිදු ක්‍රිෂාන්ත මයා, කුරුඳුවත්ත, හොරවල, හඹුරුගල, බෙන්තොට | මද්දුම කුමාරගේ චන්දන පුෂ්පකුමාර මයා හොරවල, හඹුරුගල, බෙන්තොට |
| (02) 40637 | ලියනගේ පියවතී පෙරේරා මිය අංක 95/5, දෙවන පටුමග, විහාර මාවත, කොතලාවල, කඩුවෙල | අරඹ ගම්ලද්දලාගේ අජන්තා ගම්ලත් මුදියන්සේ අංක 144/5සී, බතලවත්ත, තලාහේන, මාලඹේ |
| (03) 40652 | හෙට්ටිආරච්චිගේ ඇනා සුමංගලී තිසේරා මිය, අංක 254/3, පහල, කරගහමුණ, කඩවත | කළුආරච්චිගේ අනිල් ගාමිණී මයා, අංක 132, මංගල මාවත, ඉහළ කරගහමුණ, කඩවත |
| (04) 40656 | රත්නම් ත්‍යාගරාජා චන්ද්‍රහසන් මයා, අංක 44, සහබෝ මාවත, පස්සර | පලනි අප්පන් මුතුකුමාරන් මයා අංක 1, මඩොල්සිම පාර, පස්සර |
| (05) 40659 | හෙට්ටිආරච්චිගේ දොන් ජයරත්න අල්විස් මයා, අංක 113, ජාතික නිවාස යෝජනා ක්‍රමය, වේවැල්දූව කැළණිය | මාලඹගේ සිරියලතා සිගේරා මිය අංක 48/8බී, ලංකාමාතා මාවත, මහබාගේ, රාගම |

| *ඉල්ලුම් පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (06) 40665 | හෙට්ටිආරච්චිල්ලාගේ ඉෂන්කා කුමාරි හෙට්ටිආරච්චි මිය, එෆ්. 255/04, දේවාල පාර වැන්දල, රුවන්වැල්ල | හිගුරල ආරච්චිලාගේ ලක්සිරි රුවන් කුමාර මයා, අංක 20, සමනල පාය, කඹුරාපොල, දෙහිඕවිට |
| (07) 40666 | උඩුගම මුදියන්සේලාගේ ස්වර්ණා රත්නමාලී උඩුගම මිය, කඳන්හේන වත්ත, උඩුගම, අටාල | සමරප්පෙරුම මුදියන්සේලාගේ විජිත රෝහණ සමරප්පෙරුම මයා, තොටගම, රඹුක්කන |
| (08) 40676 | 1. හේවා යද්දෙහිගේ සැම්නෝනා මිය 2. අතුරුගිරියගේ සයිමන් අප්පුහාමි මයා එන්. ජී. ප්‍රියන්ත මයා බාරේ, අංක 138, මහවෙනාවල, දෙහිඅත්තකණ්ඩිය | මග්ගොනගේ රංජනී ප්‍රනාන්දු මිය, ඉකිලියාදෙණිය, විලේගොඩ, කළුතර උතුර |
| (09) 40688 | ඇඹුල්දෙනියගේ දෝන මනෝජා ප්‍රියදර්ශනී මිය, අංක 311/එල්/3, ගෝනමඩිත්ත පාර, කැස්බෑව, පිළියන්දල. | 1. ගීකියනලාගේ සෝමසිරි මයා, අංක 37/29, මඩවලවත්ත, බෙරවාවල, මඩපාත, පිළියන්දල 2. සිංහාර ආරච්චිලාගේ ධනපාල, *හෙවත්* ධනුෂ්ක මයා, අංක 14/7, 1 වන පටුමග, පිළිකාරෝහල පාර, මහරගම. |

09-948

---

## වන්දනා පනත

### 2007 වර්ෂයේ පාන්ඩිරුප්පු ශ්‍රී තුරෝපදයි අම්මාන් කෝවිලේ වාර්ෂික උත්සවය

### අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුන දෙමළ කොට්ඨාසයෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසම

මෙම දේවාලයේ 2007 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2007 සැප්තැම්බර් මස 11 වැනි දින ආරම්භවී 2007 සැප්තැම්බර් මස 29 වැනි දින නිමාව දැක්වෙන බව සියලුම වන්දනා කරුවන්ට හා අනෙකුත් අයට මෙයින් දන්වනු ලැබේ.

(02) 1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන *රජයේ ගැසට්* පත්‍රයේ සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියලුම වන්දනා කරුවන්ට හා අනෙකුත් අයට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම උත්සව භූමියේ මායිම් පහත සඳහන් පරිදි බව කරුණාවෙන් සලකන්න.

*උතුරට* : පාන්ඩිරුප්පු පුල්ලෙයාර් කෝවිල පාර ;
*නැගෙනහිරට* : පාන්ඩිරුප්පු වෙරළ පාර ;
*දකුණට* : කල්මුන පාන්ඩිරුප්පු මේයින් පාර ;
*බස්නාහිරට* : පෙරියකුලම් බැම්ම පාන්ඩිරුප්පු.

ටී. ප්‍රසාන්ත්,
ප්‍රාදේශීය ලේකම්,
කල්මුණ (දෙ. කො).

09-1061

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0006 5003 9009.

2005 ඔක්තෝබර් මස 27 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුරුණෑගල මධ්‍යම වෙළඳපොල, අංක 57 හි ගල්බොක්ක හේවගේ ලලිත් පද්මකුමාර යන අය බන්ධනදායී වශයෙන් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 පෙබරවාරි මස 27 දාතම හා අංක 9257 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2003 ඔක්තෝබර් මස 02 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසිලක්ෂ හැත්තෑපන් දහස් දෙසීය අසූ අටයි ශත දෙකක (රු. 2,075,288.02) මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිලක්ෂ හැත්තෑපන් දහස් දෙසිය අසූ අටයි ශත දෙකක (රු. 2,075,288.02) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හයලක්ෂ හතලිස් එක් දහස් දෙසීයක (රු. 6,41,200) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2003 ඔක්තෝබර් මස 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 9257 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුව් අධක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වෑ උඩ විල්ලි හත්පත්තුවේ, තිරගන්දහේ කෝරළේ, බෝයගනේ විල්බාව තල්කොටේ සහ නයිලිය යන ගම්මානවල පිහිටි රෙග්ලන්ඩ් එස්ටේට් නමැති ඉඩමට හා ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2000 ජනවාරි මස 04 දාතම හා අංක 2714 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කොට දක්වා ඇති කුරුණෑගල ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A1420/221 යටතේ ලියාපදිංචි කොට ඇති, උතුරට : අංක 164 පිඹුරේ ලොට් 1 ද ප්‍රධාන ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : අංක 2714 පිඹුරේ ලොට් 2 ද, දකුණට : ප්‍රධාන ඉඩමේ ඉතිරි ප්‍රදේශය ද සහ බටහිරට : පාර (පාවිච්චි නොකල) ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිහයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 30.40) වන සම්පූර්ණ ඉඩම් කොටස එහි පිහිටි සහ එයට අදාල වගාවන් හා අනෙකුත් සියලුම දේ සමග සහ බලයලත් මිනින්දෝරු එල්. ඩී. මොල්ලිගොඩ විසින් සාදන ලද 2000 ජනවාරි 04 දාතම හා අංක 2714 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති පොදු මාර්ග අයිතියක් ලෙස ප්‍රවේශ මාර්ගයක් වන මාර්ග භාවිත කිරීමේ හා නඩත්තු කිරීමේ අයිතිය ද සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-1154/2

## සීමාසහිත සෙලාන් බැංකුව - ජාඇල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.05.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0270-01293383-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් සහතික කරන ලද 2003.09.08 දිනැති අංක 1008 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ජාඇල පදිංචි වර්ණකුලසූරිය ටෙරන්ස් සුජිත් ලොවේ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හැත්තෑ එක්දහස් තිස් නවයයි ශත පනස් හතක (රු. 2,071,039.57) මුදලක්, 2006 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,071,039.57 මුදල ද, 2006 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1008 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ දකුණු අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දඬුගම් පේරුව ඒකකයේ, ඒකළ-කුරුඳුවත්ත පිහිට බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. වීරසිංහ විසින් සාදන ලද 1994 ජනවාරි මස 23 දිනැති අංක 464 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඇලෙක්සැන්ද්‍රා එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 21 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 50 ද, නැගෙනහිරට : කැබලි අංක 20 ද, දකුණට : කැබලි අංක 15 ද, බස්නාහිරට : කැබලි අංක 22 ද යන මායිම් තුළ පර්චස් දාහතරයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 14.74) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව බී 176/205හි ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රසිද්ධ කරන අවස්ථාවේ දී අත්සන් කිරීමට සීමාසහිත සෙලාන් බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති චන්ද්‍රසිරි කොටිගල මහතාට බලය පැවරිය යුතු බවට තවදුරටත් සම්මත කර ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

09-1099

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-පිටකොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.07.31 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2004.08.26 දින හා අංක 1735 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්හිලි පේඩිගේ නිලානි සමන්තිකා යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අනූ තුන්දහස් එකසිය තිස් හතරයි ශත හතලිස් පහ (රු. 2,93,134.45) මුදලක් 2007.04.11 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,93,134.45ක මුදල ට 2007.04.12 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1735 දරන උකස් බැම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගහබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවේ වකේ උප කාර්යාලයේ තුළ මැද්දේගම ගමේ පිහිටි වකේ එස්ටේට් හෙවත් මාලිගාවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද 1990.09.07 වැනි දිනැති අංක 603 දරන පිඹුරෙහි ලොට් 38 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස උතුරට : ලොට් 46 සහ 39 ද, නැගෙනහිරට : ලොට් 39 සහ ලොට් 72 (අඩි 15ක් පළල පාරක්) ද, දකුණට : ලොට් 37 සහ ලොට් 72 (අඩි 15ක් පළල පාර) ද, බටහිරට : ලොට් 37 සහ ලොට් 46 ලෙස මායිම් වූ ඉඩම සහ එකී අංක 603 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහ හතරයි දශම නවය (අ. 0, රූ. 0, පර්. 14.9) විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 206/150හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදිය.

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1110/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව-කොග්ගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.05.24 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0560-5506500-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ගාමිනී ඩේවිඩ් විසින් සහතික කරන ලද 1997 මාර්තු 6 දිනැති අංක 1336 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ගාල්ල පදිංචි මොහමඩ් මොහමඩ් සේන් හෙවත් මොහමඩ් සේන් මොහමඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ තිස් අටදහස් පන්සිය තිහයි ශත හැත්තෑවක (රු. 6,38,530.70) මුදලක්, 2005 ඔක්තෝබර් මස 26 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 6,38,530.70 මුදල ද, 2005 ඔක්තෝබර් මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1336 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දෙසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර ගනු ලැබේ.

## උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ මහ නගර සභා සීමාව තුළ ගාලුපියද්ද පිහිටි ගාල්ල බලයලත් මිනින්දෝරු ඒ. ආර්. වීරසූරිය විසින් සාදන ලද 1996 මැයි 20 දිනැති අංක 955ඒ දරන සැලැස්ම අනුව කයිලවත්ත වෙන් කළ කැබැලි අංක 2ඒ නමැති ඉඩමෙහි ඒ, බී, සී, ඩී, ඊ සහ එෆ් ලකුණු කළ යාබද ඉඩම් කැබැලිවල එක්ස්1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : එක්ස් 6 කැබැල්ල ද, ගිණිකොණට : එක්ස් 2 කැබැල්ල ද, නිරිතට : ගාල්ල සිට මාතර දක්වා මහා මාර්ග ද සහ වයඹට : කයිලවත්ත කැබැලි අංක 1ඒ ද යන මායිම් තුළ පර්චස් තුනයි දශම තුනයි නමයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 3.390) *නොහොත්* හෙක්ටයාර් 0.00857 විශාල, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 506/88 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී ගාලුපියද්ද පිහිටි පෙර කී අංක 955ඒ දරන සැලැස්ම අනුව කයිලවත්ත වෙන් කළ කැබැලි අංක 2ඒ නමැති ඉඩමෙහි ඒ, බී, සී, ඩී, ඊ සහ එෆ් ලකුණු කළ යාබද ඉඩම් කැබැලිවල එක්ස්3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : එක්ස් 4 කැබැල්ල ද, ගිණිකොණට : කයිලවත්ත 3ඒ කැබැල්ල ද, නිරිතට : එක්ස් 2 සහ එක්ස් 6 කැබලි ද සහ වයඹට : එක්ස් 6 කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් හයයි දශම තුනයි හතරයි එකක් (අ. 0, රූ. 0. පර්. 6.341) *නොහොත්* හෙක්ටයාර් 0.01604 විශාල, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 506/89 යටතේ ලියාපදිංචි කර ඇත.

3. පෙර කී ගාලුපියද්ද පිහිටි පෙර කී අංක 955ඒ දරන සැලැස්ම අනුව කයිලවත්ත වෙන් කළ කැබැලි අංක 2ඒ නමැති ඉඩමෙහි ඒ, බී, සී, ඩී, ඊ සහ එෆ් ලකුණු කළ යාබද ඉඩම් කැබැලිවල එක්ස් 5 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : ඕවිලාන ද, ගිණිකොණට : කයිලවත්ත 3ඒ කැබැල්ල ද, නිරිතට : දුම්රිය දෙපාර්තමේන්තුවට වෙන් කළ ඉඩම ද සහ වයඹට : කයිලවත්ත 1ඒ කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් තුනයි දශම හතයි පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 3.750) *නොහොත්* හෙක්ටයාර් 0.00946 විශාල, ගොඩනැගිලි සහ එහි පිහි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 506/90 යටතේ ලියාපදිංචි කර ඇත.

4. පෙර කී ගාලුපියද්ද පිහිටි කයිලවත්ත වෙන් කළ කැබැලි අංක 2ඒ නමැති ඉඩමෙහි ඒ, බී, සී, ඩී, ඊ සහ එෆ් ලකුණු කළ යාබද ඉඩම් කැබැලිවල එක්ස්6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම තුළ දිගේ යටින් සහ උඩින් ඇතුළුවීමට පිටවීමට ප්‍රතික්‍රමන වීමට ඉඩකඩ සහ මාර්ගය සහ විදුලිය සහ ජල පහසුකම් උඩින් සහ යටින් යෙදීමට සහ අනිකුත් ප්‍රධාන නල යෙදීමේ පූර්ණ නිදහස් සහ නිරවුල් අයිතිය අවසරය සහ බලය සමග සහ එයට මායිම්, ඊසානට : එක්ස් 3 කැබැල්ල සහ දුම්රිය දෙපාර්තමේන්තු වෙන් කිරීම ද, ගිණිකොණට : එක්ස් 3 සහ එක්ස් 4 කැබලි ද, නිරිතට : එක්ස් 1 සහ එක්ස් 2 කැබලි ද සහ වයඹට : කයිලවත්ත 1ඒ කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් දෙකයි දශම හතරයි එකයි හතක් (අ. 0, රූ. 0, පර්. 2.417) *නොහොත්* හෙක්ටයාර් 0.00612 විශාල, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 506/93 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1100/1

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කිරිඳිවැල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2003 මාර්තු මස 25 දිනැති අංක 3630 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මද්දුමගේ නිමල් ශ්‍රී යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ පහළොස් දහස් නවසිය දොළහයි ශත තිස්අට (රු. 4,15,912.38)ක මුදලක් 2007.03.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 4,15,912.38 මුදලට 2007.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3630 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහනාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ, උරුවෙල්පේරුව උප කාර්යාල සීමාව තුළ කටුකුරුන්ද පිහිටි "කිතුලේලන්ද" නමැති ඉඩමේ පිහිටි ගහකොළ, ගොඩනැගිලි ආදී සියලු දේ සමහ එකී ඉඩමට බලයලත් මානක එස්. එම්. චන්ද්‍රසිරි විසින් මැන සාදන ලද 1998 නොවැම්බර් 19 වැනි දිනැති අංක 1370 සහ ලොට් එෆ් 1 දරන ඉඩම් කොටස ඊසානට : මෙරිල් පෙරේරා සහ නිව්ටන් පෙරේරා අයත් ලොට් ජී යන ඉඩම් කොටස ද, ගිණිකොණට : ප්‍රධාන පාරෙන් ද, නිරිතට : කිත්සිරි පීරිස්ට අයත් මෙම ඉඩමේ ලොට් ඊ දරන කොටස ද සහ වයඹට : විලි ඇලෙන්ද සහ මෙකී මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහතුනයි දශම පනස් නවය (අ. 0, රූ. 1, පර්. 13.59) ක් විශාලත්වය ඇති ඉඩම සහ ඉහත කී අංක 1370 දරන ඉඩම ගම්පහ දිස්ත්‍රික්කයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 543/64 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1110/3

පීවීඑස් 5718.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "සමන් ෆර්නිෂර්ස් ඩෙකරේටර්ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1979.05.28 දින සංස්ථාපිත සමාගමක් වන සමන් ෆර්නිෂර්ස් ඇන්ඩ් ඩෙකරේටර්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සමන් ෆර්නිෂර්ස් ඇන්ඩ් ඩෙකරේටර්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09 – 927

---

එන්(පීවීඑස්)2996.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "ඩී. පී. ඩබ්ලිව්. බිල්ඩින්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1986.10.31 දින සංස්ථාපිත සමාගමක් වන ඩී. පී. ඩබ්ලිව්. බිල්ඩින්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ඩී. පී. ඩබ්ලිව්. බිල්ඩින්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09 – 928

---

එන්(පීවීඑස්)4251.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "සීපෝර්ට් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.02.15 දින සංස්ථාපිත සමාගමක් වන සීපෝර්ට් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සීපෝර්ට් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09 – 929

---

එන්(පීවීඑස්)4589.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "කොන්සොලිඩේටඩ් ඉන්ටර්නැෂනල් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.06.08 දින සංස්ථාපිත සමාගමක් වන කොන්සොලිඩේටඩ් ඉන්ටර්නැෂනල් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, කොන්සොලිඩේටඩ් ඉන්ටර්නැෂනල් ඒජන්සීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09 – 930

එන්(පීවීඑස්)3586.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිලෝන් ඔපරේටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1987.06.22 දින සංස්ථාපිත සමාගමක් වන සිලෝන් ඔපරේටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, සිලෝන් ඔපරේටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09–931

---

එන්(පීවීඑස්)4453.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඇම්. ඒ. රත්නවර්ධන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.04.20 දින සංස්ථාපිත සමාගමක් වන ඇම්. ඒ. රත්නවර්ධන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ඇම්. ඒ. රත්නවර්ධන ඇන්ඩ් කොම්පැනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09–932

එන්(පීවීඑස්)4765.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "නැචුරල් ෆුඩ් ඇන්ඩ් බෙවරේජස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.08.15 දින සංස්ථාපිත සමාගමක් වන නැචුරල් ෆුඩ් ඇන්ඩ් බෙවරේජස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, නැචුරල් ෆුඩ් ඇන්ඩ් බෙවරේජස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09–933

---

එන්(පීවීඑස්)4990.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ඇබ්ඩා කන්සල්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.11.08 දින සංස්ථාපිත සමාගමක් වන ඇබ්ඩා කන්සල්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, ඇබ්ඩා කන්සල්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09–934

එන්(පීවීඑස්) : 3391.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394 (3) වැනි වගන්තිය යටතේ "ඇස්. ඇෆ්. ටී. පිල්ම්ස් ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1938 වේ අංක 51 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1971.11.08 දින සංස්ථාපිත සමාගමක් වන ඇස්. ඇෆ්. ටී. fපිල්ම්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඇස්. ඇෆ්. ටී. fපිල්ම්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 30 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-925

---

එන්(පීවීඑස්) : 5737.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වැනි වගන්තිය යටතේ "ලැප් සිලෝන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1989.09.28 දින සංස්ථාපිත සමාගමක් වන ලැප් සිලෝන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාශ කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ලැප් සිලෝන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දීය.

09-935

---

එන්(පීවීඑස්) : 3554

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394 (3) වැනි වගන්තිය යටතේ "ජේවයිස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1987.06.09 දින සංස්ථාපිත සමාගමක් වන ජේවයිස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ජේවයිස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-926

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂවරුන් විසින් 1990 අංක 4 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සංස්කරණයෙන් සම්මත කර ගන්නා ලද යෝජනාව

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ අගෝස්තු මස 29 වන දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. එන්. පී. පෙරේරා විසින් සහතික කරන ලද වර්ෂ 2004 ක් වූ පෙබරවාරි මස 3 වන දිනැති අංක 391 දරන, සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. විජේරත්න විසින් සහතික කරන ලද වර්ෂ 2005 ක් වූ අප්‍රේල් මස 27 වන දිනැති අංක 158 දරන, වර්ෂ 2005 ක් වූ මාර්තු මස 08 වන දිනැති, අංක 291 දරන, වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 05 වන දිනැති අංක 408 දරන සහ වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 04 වන දිනැති අංක 439 දරන උකස් බැඳුම්කර මගින්, ගොඩගම, හයිලෙවල් පාර අංක 607 සහ දැනට හෝමාගම, ගොඩගම, අංක 609 දරන ස්ථානයේ පදිංචි ජයලත් විජේතුංග සමරනායක සහ වැවලගේ ක්‍රිෂාන්ති සමරනායක යන අයවලුන් ඔවුන් විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපල සහ පරිශ්‍රයන් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76 හි සහ දැන් කොළඹ 02,

යූනියන් පෙදෙස, අංක 242හි) පිහිටි (මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද හෙයින් ද,

තවද, එකී බැඳුම්කර මගින් සුරක්ෂිත කරන ලද එකී මූල්‍ය පහසුකම මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී ජයලත් විජේතුංග සමරනායක සහ වැවලගේ ක්‍රිෂාන්ති සමරනායක යන අය පැහැර හරින ලදුව වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට එකී පහසුකම මත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත එකී බැඳුම්කර මත රුපියල් දාහහත් මිලියන හත්ලක්ෂ හැට දහස් දෙසීය විසි පහකුත් සත දහහතක (රු.17,760,225.17) මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, එකී බැඳුම්කරවලින් සුරක්ෂිත කරන ලද පහසුකම් මත රුපියල් මිලියන දහ හතකුත් හත් ලක්ෂ හැට දහස් දෙසීය විසි පහයි සත දහ හතක (රු. 17,760,225.17) එකී මුදලද වර්ෂ 2007 ක් වූ ජූලි මස 18 වන දින සිට විකිණීමේ දිනය දක්වා, තවදුරටත් පොලිය ද අයිරා අණකර පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් මිලියන දෙකකුත් තුන් ලක්ෂ හැට තුන් දහස් තුන්සිය හැත්තෑ පහකුත් සත හැත්තෑ එකක (රු. 2,363,375.71) මුදලක් මත, එක් වර්ෂයකට සියයට හතළිහක (40%) පොලියක් ද, සහ අංක 1 දරන වාර ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියන හයලක්ෂ තිස් එක් දහස් දෙසීය අනූහතකුත් සත පණස් එකක (රු.1,631,297.51) මුදලක් මත, එක් වර්ෂයකට සියයට විස්සයි දශම පහක(20.5%) පොලියක් ද, සහ අංක 2 දරන වාර ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් දෙලක්ෂ දහතුන් දහස් පන්සිය හතලිස් නවයකුත් සත අසූ හයක (රු.213,549.86) මුදලක් මත, එක් වර්ෂයකට සියයට විස්සයි දශම පහක(20.5%) පොලියක්ද සහ අංක 3 දරන වාර ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් තුන්ලක්ෂ අසූ හතර දහසක (රු.384,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට විසි හතයි දශම හතරක (27.4%) පොලියක් ද සහ කෙටි කාලීන ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියන විසි හතර දහස් පන්සිය විසි පහකුත් සත හැත්තෑ හයක (රු.1,024,525.76) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ අංක 01 දරන ආනයන මූල්‍ය ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියන හයලක්ෂ හත් දහසක (රු.1,607,00) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ අංක 02 දරන ආනයන මූල්‍ය ණය පහසුකම් වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන තුන් මිලියන තුන් දහසක (රු.3,003,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට හතළිහක (40%) පොලියක් ද සහ අංක 01 දරන ඇසුරුම් ණය, ණය පහසුකම වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් මිලියන තුනක (රු. 3,000,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලිය් ද සහ අංක 02 දරන ඇසුරුම් ණය, ණය පහසුකම වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියනක (රු.1,000,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ අංක 03 දරන ඇසුරුම් ණය, ණය පහසුකම වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් ලක්ෂ හයක (රු. 600,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ අංක අංක 04 දරන ඇසුරුම් ණය, ණය පහසුකම වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියන එක් ලක්ෂයක (රු.1,100,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ අංක 05 දරන ඇසුරුම් ණය, ණය පහසුකම වෙනුවෙන් වර්ෂ 2007 ක් වූ ජූලි මස 17 වන දින වන විට පැවති හිඟ මුල් මුදල වන රුපියල් එක් මිලියනයක (රු.1,000,000) මුදලක් මත, එක් වර්ෂයකට සියයට තිස් තුනක (33%) පොලියක් ද සහ මාසික විරාමයක් සහිතව වැල් පොලිය පදනමක් මත, ප්‍රචාරක පිරිවැය සහ සිදු කරන ලද වෙනත් ගාස්තු ද එවක් පටන් ලැබුන ගෙවීම් (කිසිවක්) වේ නම් ඒවා ද අඩු කර, අය කර ගැනීම සඳහා කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙන්දේසිකරුවන්ගේ ත්‍රිවංක සේනානායක මහතා විසින්, මෙහි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ සහ පරිශ්‍රයන්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, මෙයින් යෝජනා සම්මත කරන ලදී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ගොඩගම පිහිටි (බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද වර්ෂ 1980 ක් වූ මැයි මස 28 වන දිනැති අංක 2145 දරන පිඹුරේ ලොට් 31 සහ 32හි නැවත මැන (ඒකාබද්ධ කිරීමක් වන) කැන්දහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. වික්‍රමරත්න විසින් සාදන ලද වර්ෂ 2003 ක් වූ ජූලි මස 14 වන දිනැති අංක අංක 879 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 1 දරන කැබැල්ලට මායිම් උතුරට : මාර්ගය ද, නැගෙනහිරට : අංක 2145 දරන පිඹුරේ ලොට් 30 ද, දකුණට : හයිලෙවල් පාර ද සහ බස්නාහිරට : අංක 2145 දරන පිඹුරේ ලොට් 33 ද වන එකී අංක 2145 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 38.70) වන ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ජී 1033/303 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම් කොටස මෙහි පහත සවිස්තරව විස්තර කර ඇති එකී අංක 2145 දරන පිඹුරේ ලොට් 31 සහ 32 ඒකාබද්ධ කිරීමෙන් සෑදී ඇත.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, ගොඩගම පිහිටි කැන්දහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද වර්ෂ 1980 ක් වූ මැයි මස 28 වන දිනැති අංක 2145 දරන පිඹුරේ ලොට් 31 වශයෙන් සලකුණු කර දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම සහ පරිශ්‍රය, එකී ලොට් 31 දරන කැබැල්ලට මායිම් උතුරට : ලොට් සී (මාර්ගය සඳහා වෙන් කිරීම් ද, නැගෙනහිරට : ලොට් 30 ද, දකුණට : හයිලෙවල් පාර ද සහ බස්නාහිරට : ලොට් 32 ද වන එකී අංක 2145 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වන ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ජී 1033/240 හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, ගොඩගම පිහිටි කැන්දහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද වර්ෂ 1980 ක් වූ මැයි මස 28 වන දිනැති අංක 2145 දරන පිඹුරේ ලොට් 32 වශයෙන් සලකුණු කර දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් සහ පරිශ්‍රය, එකී ලොට් 32 දරන කැබැල්ලට මායිම් : උතුරට : ලොට් සී (මාර්ගය සඳහා වෙන් කිරීම ද, නැගෙනහිරට : ලොට් 31 ද, දකුණට : හයිලෙවල් පාර ද සහ බස්නාහිරට : ලොට් 33 ද, වන එකී අංක 2145 පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහනවයක් (අ. 0, රූ. 0, පර්. 19) වන ඉඩම, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ජී 1033/241 හි ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

09-1065

## සීමාසහිත සෙලාන් බැංකුව -හැව්ලොක් ටවුන් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0830-පී18941-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මැයි 24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද 2005 නොවැම්බර් 28 දිනැති යන්ත්‍ර සූත්‍ර බැඳුම්කරය සහ 2005 නොවැම්බර් 23 දිනැති බඩු තොග උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වැල්ලම්පිටිය සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 40870 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන හැජී ඩේ ලංකා (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් පනස් එක් ලක්ෂ දහඅටදහස් දෙසිය හැට දෙකයි ශත හතලිස් හතක (රු. 51,18,262.47) මුදලක්, 2006 මැයි 21 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 51,18,262.47 මුදලද, 2006 මැයි 22 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී යන්ත්‍ර සූත්‍ර සහ බඩු තොග ගිවිසුම් මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛන වල සවිස්තරව විස්තර කර ඇති යන්ත්‍ර සූත්‍ර සහ බඩු තොග බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

යන්ත්‍ර සූත්‍ර

| *අංකය* | *යන්ත්‍රයේ නම* | *විස්තරය* | *නිෂ්පාදිත දිනය* |
|---|---|---|---|
| 1. | හයිඩ්‍රොලික් ප්‍රෙස් | 200ටී | 1996 |
| 2. | සී එස් ප්‍රෙස් | 160ටී | 1996 |
| 3. | පවර් ප්‍රෙස් | 10ටී | 1994 |
| 4. | පවර් ප්‍රෙස් | 7ටී | 1993 |
| 5. | පවර් ප්‍රෙස් | 7ටී | 1993 |
| 6. | පවර් ප්‍රෙස් | 7ටී | 1994 |
| 7. | පවර් ප්‍රෙස් | 5ටී | 1993 |
| 8. | පවර් ප්‍රෙස් | 5ටී | 1994 |
| 9. | පවර් ප්‍රෙස් | 3ටී | 1993 |
| 10. | පවර් ප්‍රෙස් | 3ටී | 1993 |
| 11. | පවර් ප්‍රෙස් | 3ටී | 1993 |
| 12. | පවර් ප්‍රෙස් | 3ටී | 1993 |
| 13. | පවර් ප්‍රෙස් | 3ටී | 1993 |
| 14. | ස්පොට් වෙල්ඩර් | 3කේ | 2000 |
| 15. | ස්පොට් වෙල්ඩර් | 3කේ | 2001 |
| 16. | ස්පොට් වෙල්ඩර් | 3කේ | 2002 |
| 17. | ස්පොට් වෙල්ඩර් | 3කේ | 2002 |
| 18. | ස්පොට් වෙල්ඩර් | 5කේ | 2002 |
| 19. | ස්පොට් වෙල්ඩර් | 5කේ | 2000 |
| 20. | පොලිෂිං ලයින් (ඒ) | 5සෙට්ස් | 2002 |
| 21. | වොෂර් | | 1993 |
| 22. | පොලිෂිං වක් | | 1994 |
| 23. | කම්ප්‍රෙෂර් | | 1994 |
| 24. | ෂියරිං ලයින් | | 1995 |
| 25. | ෂියරිං එම්/සී | | 1995 |
| 26. | කන්වෙයර් ආදිය | | 1995 |
| 27. | උල්ට්‍රා සොනික් වොෂර් | | 1994 |
| 28. | බෙන්ඩිං එම්/සී | | 2000 |
| 29. | ස්කෲ කම්ප්‍රෙෂර් | | 2000 |
| 30. | ඉලෙක්ට්‍රික් පෝක් ලිෆ්ට් | | 2000 |
| 31. | පෝක් ලිෆ්ට් එක සඳහා | | 2000 |
| 32. | ලේත් ෆික්සිං | | 2001 |
| 33. | කන්ඩෙන්සර් ස්පොට් | | 2002 |
| 34. | ඉන්වර්ටර් ආගන් වෙල්ඩර් | | 2002 |
| 35. | ඔටෝ පැකිං එම්/සී | | 2002 |
| 36. | කන්වෙයර් | | 2002 |
| 37. | අල්ට්‍රා සොනික් වොෂර් | | 2003 |
| 38. | අල්ට්‍රා සොනික් වොෂර් | | 2003 |
| 39. | කම්ප්‍රෙෂර් | | 1991 |
| 40. | ලිෆ්ට් | | 1994 |
| 41. | එයාර් සොෆ්ට් ආදිය | | 1994 |
| 42. | කන්වෙයර් | | 1994 |
| 43. | වෙල්ඩර් | | 1995 |
| 44. | බෙන්ඩිං එම්. සී. (එස්. ඒ) | | 1996 |

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, වැල්ලම්පිටිය, මීතොටමුල්ල විහාර මාවත වරිපනම් අංක 3ඒ දරන පරිශ්‍රයෙහි ඇති ලීබඩු, සවිකිරීම් සහ ද්‍රව්‍ය එක්ව සහ වෙන් වෙන්ව සහ සියලු වෙනත් භාණ්ඩ සහ සෑම මාදිලියකම සහ ඕනෑම අකාරයක වෙනත් චංචල දේපලවලින් සමන්විත වෙළඳ බඩු තොග, නිමි සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ද්‍රව්‍ය (ඒ සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින් මතු බන්ධනදායීට හිමි වෙළඳ බඩු තොග, ද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.) සහ බන්ධනදායී විසින් පෙරකී දිස්ත්‍රික්කය තුළ දැන් හෝ කවර කලක සහ මින් මතු කලින් කලට ව්‍යාපාරය ගෙනයනු ලබන සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ කලින් කළට සහ මින් මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා සියලු අවස්ථාවන්හි බන්ධනදායී ගේ වෙළඳ බඩු තොග, නිමි සහ නොනිමි භාණ්ඩ සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක වෙනත් චංචල දේපල ගෙන ගොස් බහාලිය හැකි සහ බන්ධනදායී විසින් ඕනෑම වෙලාවක මින්මතු කලින් කලට රැගෙන ගොස් ව්‍යාපාරය හෝ වෙළඳාම හෝ ගබඩා කර ගෙන යනු ලැබිය හැකි සියලු හෝ ඕනෑම වෙනත් ස්ථානයක හෝ ස්ථානයන්හි ඇති බන්ධනදායී ගේ වෙළඳ බඩු තොග, නිමි හෝ නොනිමි භාණ්ඩ සහ ද්‍රව්‍ය සහ වෙනත් චංචල දේපල.

II

පහත සඳහන් භාණ්ඩ වලින් සමන්විත ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ ඕනෑම මාදිලියක වෙනත් සියලු භාණ්ඩ එක්ව සහ වෙන් වෙන්ව :

*අමු ද්‍රව්‍ය* :

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ස්ටේන්ලස් ස්ටීල් කොයිල් | 8000 කිග්‍රෑ |
| එස්යූඑස් 304ජේඅයි (0.5 x 1000 x සී) | 2100 කිග්‍රෑ |

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| එස්යූඑස් 304ජේඅයි (0.6 x 1219 x සී) | 2050 කිග්‍රෑ |
| ඩ්‍රයිඩ් බ්ෆිපින් ක්ලෝත් 18″ | 250රීජ් |
| ඩ්‍රයිඩ් බ්ෆිපින් කලෝත් 16″ | 275රීජ් |
| බ්ෆිපින් ක්ලෝත් 18″ | 210රීජ් |
| බ්ෆිපින් ක්ලෝත් 16″ | 225රීජ් |
| බ්ෆිපින් වයිට් ක්ලෝත් 16″ | 40රීජ් |
| කොට්න් බයස් 16″ (40මෙෂ්) | 85රීජ් |
| කොට්න් බයස් 16″ (150මෙෂ්) | 90රීජ් |
| කොට්න් ප්ලැනල් බ්ෆිපින් | 180රීජ් |
| බ්ලූ බ්ෆ් | 165රීජ් |
| බ්ෆ් කෝටිං | 250රීජ් |
| ක්‍රෝම් ඔක්සයිඩ් (ඒ ක්ලාස්) | 120කිග්‍රෑ |
| ක්‍රෝම් ඔක්සයිඩ් (බී ක්ලාස්) | 100කිග්‍රෑ |
| ඇලුමිනා 25කේ | 120කිග්‍රෑ |
| ෂියරිං ඇසිඩ් | 100කිග්‍රෑ |
| පොලිෂිං වැක්ස් | 40රීජ් |
| ස්පෞට්ස් සහ උපාංග | 2500 කෑලි |
| කප්ස් | 2000 කෑලි |
| කවර | 1500 කෑලි |
| බ්‍රැකට් | 2000 කෑලි |
| ශින්ජ් | 2000 කෑලි |
| හැන්ඩ්ල්, බෝල්ට් ස්ප්‍රින්ස් | 6000 කෑලි |
| හැන්ඩ්ල් 2 | 2000 කෑලි |
| ඩ්‍රෝවිං ඔයිල් | 140රීජ් |
| මෝල්ඩිං ඩයි සෙට්ස් | 150රීජ් |

නිමි භාණ්ඩ :

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| මිනි බිග් 1.7එල් | 18000 කෑලි |
| මිනි බිග් 1.5එල් | 12000 කෑලි |

ප්‍රගමන වැඩ :

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| මිනි බග් 1.7එල් | 750 කෑලි |
| මිනි බග් 1.5එල් | 1000 කෑලි |

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහනගර සභාව තුළ කොළඹ වරායේ වාප්පුවල සහ ගබඩා වල බහා ඇති භාණ්ඩ සියල්ලම මෙහි මින්මතු සාමූහික වශයෙන් "බන්ධනදායීට හිමි වරායේ ද්‍රව්‍ය සහ භාණ්ඩ" යනුවෙන් හඳුන්වනු ලැබේ.

III

බස්නාහිර පලාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, කටුනායක ගුවන් තොටුපොල ගබඩා වල සහ ගුදම්වල බහා ඇති ඉහත සඳහන් භාණ්ඩ වලින් සමන්විත එක් එක් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ වෙනත් සියලු ඕනෑම මාදිලියක භාණ්ඩ මෙහි මින්මතු සාමූහික වශයෙන් "බන්ධනදායීට හිමි ගුවන් තොටුපල ද්‍රව්‍ය සහ භාණ්ඩ" යනුවෙන් හඳුන්වනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

09-1100/2

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කලි සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0300001463.

ණයකරුගේ සම්පූර්ණ නම : ගමරාච්චිලාගේ අනුර බණ්ඩාර.

මතුගම ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එච්. එම්. ඩී. බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද අංක 408 හා 1999.05.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්හත්දහස් පන්සිය හතලිස්හයයි ශත දෙකක (රු. 57,546.02) ක මුදලක් වර්ෂ 2004.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතලිස්හයදහස් අටසිය හතයි ශත පනස්හතරක (රු. 46,807.54) මුදල ද වර්ෂ 2004.09.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දහදහස් හත්සිය තිස්අටයි ශත හතලිස්අටක් (රු. 10,738.48) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස්හත්දහස් පන්සිය හතලිස්හයයි ශත දෙකක් (රු. 57,546.02) ද,

(2) එකී රුපියල් හතලිස්හයදහස් අටසිය හතයි ශත පනස්හතරක (රු. 46,807.54) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.02% බැගින් වන පොළියක් 2004.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ නොවැම්බර් මස 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, මග්ගොන්බැද්දහි මුංහේන ග්‍රාමයෙහි පිහිටි සිංහලදෙනියලන්ද සහ සිංහලදෙනියකැලේ නමැති ඉඩමට 1998.08.20 දින වයි. සී. ද සිල්වා මානක නැන විසින් මැන සම්පාදිත අංක 820 පිඹුර ප්‍රකාර ලොට් 103 සහ 104ට මායිම්, උතුරට : ලොට් 92 සහ 93 ද, නැගෙනහිරට : ලොට් 105 ද, දකුණට : ලොට් 13 ද, බස්නාහිරට : ලොට් 01 (පාරට වෙන් කරන ලද) ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 20.2) වපසරියකින්

යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමහ කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 216/102හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1120

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001562.

ණයකරුගේ සම්පූර්ණ නම : ගොමුල්ලාගේ දොන් ප්‍රැන්කෝ රාජරත්න.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පී. පී. ආර්. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 2746 හා 2005.07.04 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මීන් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ පනස්දහස් තුන්සිය අසූහයයි ශත හතක (රු. 5,50,386.07) ක මුදලක් වර්ෂ 2007.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූපන්දහසක (රු. 4,95,000) මුදල ද වර්ෂ 2007.01.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස් පන්දහස් තුන්සිය අසූහයයි ශත හතක් (රු. 55,386.07) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ පනස්දහස් තුන්සිය අසූහයයි ශත හතක (රු. 5,50,386.07) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ අනූපන්දහසක (රු. 4,95,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.75% බැගින් වන පොලියක් 2007.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මාර්තු මස 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම්පත්තුවේ, අළුත්කුරු කෝරළේ, ඇපාමුල්ල ග්‍රාමයෙහි පිහිටි ඇහැටුගහවත්ත නමැති ඉඩමට 1986.11.14 දින පී. එච්. ඊ. මෙන්ඩිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4477 පිඹුර ප්‍රකාර ලොට් 2ට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 4477හි ලොට් 1 ද, නැගෙනහිරට : ජේ. ඩී. නෝබිස් සහ සී. ජයමාන්නගේ ඉඩම ද, දකුණට : සී. ජයරත්නගේ ඉඩම ද, බස්නාහිරට : පිඹුරු අංක 4477හි ලොට් 1 සහ සී. ජයමාන්නගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමහ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B516/228හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1121

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/44/00029.

ණයකරුගේ සම්පූර්ණ නම : නිහාල් රත්නායක කිත්මිණි ප්‍රසාදිකා රත්නායක.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ. කැප්පෙටිපොල විසින් ලියා සහතික කරන ලද අංක 9939 හා 1995.03.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මීන් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ විසිඅටදහස් පනහක (රු. 4,28,050) ක මුදලක් වර්ෂ 2003.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ අනූනමදහස් අටසිය අසූපහයි ශත හැත්තෑඑකක (රු. 3,99,885.71) මුදල ද වර්ෂ 2003.10.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඅටදහස් එකසිය හැටහතරයි ශත විසිනමයක

(රු. 28,164.29) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ විසිඅටදහස් පනහක (රු. 4,28,050) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ අනූනමදහස් අටසිය අසූපහයි ශත හැත්තෑඑකක (රු. 3,99,885.71) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොළියක් 2003.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2003ක් වූ දෙසැම්බර් මස 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවේ බෝවල පිහිටි දංගොල්ල 2 වන පටුමගේ වරිපනම් අංක 22/ඒහි දංගොල්ල නමැති ඉඩමට 1990.10.31 දින ඩබ්. ඩබ්. යාපා බණ්ඩාර මානක තැන විසින් මැන සම්පාදිත අංක එල් ඩී/91/03 දරන පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : ලොට් 02 ද, ඊසානට : ලොට් 155හි කොටසක් ද, ගිණිකොණට : දංගොල්ල ගමේ සිට දංගොල්ල පාරට ඇති පාර ද, නිරිතට : ලොට් 155හි කොටසක් ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම නමයක (අ. 0, රූ. 0, පර්. 15.9) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 238/243හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1122

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0127000073.

ණයකරුගේ සම්පූර්ණ නම : හේවා ෆොන්සේකලාගේ ශාන්ත මනෝහාර ෆොන්සේකා සහ වඩුගේ ගීජ්තිකා රුවනි ෆොන්සේකා හෙවත් ප්‍රනාන්දු.

ගල්කිස්ස ප්‍රසිද්ධ නොතාරිස් සී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද අංක 395 හා 2002.06.12 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දොලොස්ලක්ෂ හැත්තෑනමදහස් දෙසිය පනස්පහයි ශත හතළිහක (රු. 12,79,255.40) ක මුදලක් වර්ෂ 2005.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ පනස්නමදහස් තුන්සිය විස්සයි ශත පනස්පහක (රු. 7,59,320.55) මුදල ද වර්ෂ 2005.11.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ දහනමදහස් නවසිය තිස්හතරයි ශත අසූපහක (රු. 5,19,934.85) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දොලොස්ලක්ෂ හැත්තෑනමදහස් දෙසිය පනස්පහයි ශත හතළිහක (රු. 12,79,255.40) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ පනස්නමදහස් තුන්සිය විස්සයි ශත පනස්පහක (රු. 7,59,320.55) මුදල මත අයවිය යුතු වර්ෂයකට 19% බැගින් වන පොළියක් 2005.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ ජනවාරි මස 24 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවේ, කොරළවැල්ල ග්‍රාමයෙහි පළවැනි පටුමගෙහි වරිපනම් අංක 32/3ඩීහි පිහිටි මුලතොටේ වත්ත සහ මාදන්ගහවත්ත නමැති ඉඩමට 1994.09.22 දින එම්. එම්. ඩී. කුරේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 151 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : ඩබ්. ඒ. එල්. ද සිල්වා මානක තැන විසින් මැන සාදන ලද අංක 2178හි දැක්වෙන ලොට් 12 (අඩි 20 පළල පාර) ද, නැගෙනහිරට : පිඹුරු අංක 3749හි දැක්වෙන ලොට් 6 ද, දකුණට : සුසන්ත සිරිරත්න යන අයට අයත් ඉඩම ද, බටහිරට : පිඹුරු අංක 3749හි දැක්වෙන ලොට් 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමහ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2492/47හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1123

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/00/00873.

ණයකරුගේ සම්පූර්ණ නම : පහල රස්නකගෙදර සුනිල් රත්නායක.

මාවනැල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. රණතුංග විසින් ලියා සහතික කරන ලද අංක 7382 හා 1998.09.23 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් එකසිය අසූඑකයි ශත දොළහක (රු. 1,21,181.12) ක මුදලක් වර්ෂ 2002.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූතුන්දහස් එකසිය අනූහයයි ශත අනූඅටක (රු. 93,196.98) මුදල ද වර්ෂ 2002.09.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහත්දහස් නවසිය අසූහතරයි ශත දාහතරක් (රු. 27,984.14) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් එකසිය අසූඑකයි ශත දොළහක (රු. 1,21,181.12) ද,

(2) එකී රුපියල් අනූතුන්දහස් එකසිය අනූහයයි ශත අනූඅටක (රු. 93,196.98) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරලේ, ගල්බොඩ පත්තුවේ, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ යටිමහන ග්‍රාමයෙ හි පිහිටි කොටිකාපොල හේන නමැති ඉඩමට 1991.11.08 දින එස්. එම්. සමරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 235 පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම්, උතුරට : පී. එම්. ජේ. බණ්ඩාරට අයිති උඩහ රස්නැක්ගෙහේන ද, නැගෙනහිරට : පී. එම්. ජේ. බණ්ඩාරට අයිති කාසිවත්තගෙ හේන ද, දකුණට : ඩී. බී. එස්. බණ්ඩාරගේ බෙලිගලයේදෙනිය කුඹුර ද, බටහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයක් (අ. 0, රූ 0, පර්. 36) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද සමහ කැගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 603/245හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2002ක් වූ නොවැම්බර් මස 29 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1124

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400000380.

ණයකරුගේ සම්පූර්ණ නම : මොහොමඩ් හනීෆා මොහොමඩ් ෂාරුක්.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 1377 හා 1997.11.17 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූදෙදහස් නවසිය හතළිස් හතයි ශත දොළහක (රු. 1,92,947.12) ක මුදලක් වර්ෂ 2007.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දොළොස්දහස් හාරසිය අනූඑකයි ශත දාහතක (රු. 1,12,491.17) මුදල ද වර්ෂ 2007.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් අසූදහස් හාරසිය පනස්පහයි ශත අනූපහක් (රු. 80,455.95) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අනූදෙදහස් නවසිය හතළිස් හතයි ශත දොළහක (රු. 1,92,947.12) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දොළොස්දහස් හාරසිය අනූඑකයි ශත දාහතක (රු. 1,12,491.17) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොළියක් 2007.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 10 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, දකුණු උඩපත්තුවේ, රත්නපුර මහනගර සභා සීමාව තුළ ගොඩිගමුව ග්‍රාමයේ ශ්‍රී පාද මාවතේ වරිපනම් අංක 143/5හි පිහිටි මහවෙල වත්ත නිවාස ක්‍රමය නමැති ඉඩමට 1997.06.17 දින එෆ්. සී. ඩී. හෙට්ටිආරච්චි මානක තැන විසින් මැන සම්පාදිත අංක 2700 පිඹුර ප්‍රකාර ලොට් 30ට මායිම්, උතුරට : කැබලි අංක 20 ද (පාර), නැගෙනහිරට : ලොට් 20 (පාර) ද, දකුණට : ලොට් 36 ද, බස්නාහිරට : ලොට් 31 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම හයයි හතරක් (අ. 0, රූ. 0, පර්. 15.64) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 678/136හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-1126

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ආර්. සී. එක්ස්පෝට්-0076 1000 0384.

2007 මැයි මස 24 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිළියන්දල, දෙණිය, අංක 320/1හි පදිංචි, එකී ජනරජයේ කොළඹ 2, ජස්ටිස් අක්බාර් මාවත, 3 වන මහල, ක්‍රිස්ටල් හවුස් හි ආර්. සී. එක්ස්පෝර්ට්ස් යන ව්‍යාවහාරික ව්‍යාපාරික නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන කොඩිතුවක්කු ආරච්චිගේ දිලීප චාර්ල්ස් ද සිල්වා යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 මාර්තු මස 28 දාතම හා අංක 1397 උකස් බැඳුම්කරය මත උකසට තබන ලද පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන පසයන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 මාර්තු මස 06 වැනි දිනට එකී බැඳුම්කරය මත රුපියල් දහනව ලක්ෂ හැට දෙදහස් හත්සිය තිස් නවයකුත් ශත හැත්තෑ තුනක් (රු. 19,62,739.73ක් පමණයි) ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින්, එකී රුපියල් දහනව ලක්ෂ හැට දෙදහස් හත්සිය තිස් නවයකුත් ශත හැත්තෑ තුනක (රු. 19,62,739.73ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දහඅට ලක්ෂයක (රු. 18,00,000ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් 2007 මාර්තු 07 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1937 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු කොට්ඨාසයේ, දකුණු පුත්තලම් පත්තුවේ, මදුරන්කුලියේ පිහිටි "උනවෙලිවේනෙයි" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. ඒ. බී. රාජනායගම් විසින් සාදන ලද 2005 සැප්තැම්බර් 03 දාතම හා අංක 6179 දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට නිරූපිත පුත්තලම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව P 66/275හි ලියාපදිංචි කර ඇති, උතුරට : පාර (H) ද, නැගෙනහිරට : කරුණාවතීගේ ඉඩම සහ අඩි පාර ද, දකුණට : අනුලාවතී ගේ ඉඩම ද සහ බටහිරට : අනුර පුෂ්පකුමාර සහ ජුලියස් පතිරණගේ ඉඩම ද මායිම් වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තිස් හතරයි දශම පහයි බිංදුවක් (අ. 2, රූ. 0, පර්. 34.50) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

ඉහත ලොට් A පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රතිමිණුමකි.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම්පත්තු කොට්ඨාසයේ දකුණු පුත්තලම්පත්තුවේ මදරන්කුලියේ පිහිටි "උනවෙලිවේනෙයි" නමැති පුත්තලම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව P66/275 හි ලියාපදිංචි කර ඇති, උතුරට : මහකුඹුක්කඩවෙල පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : R702හි සඳහන් ඉඩම ද සහ බටහිරට : R732හි ඉඩම ද මායිම වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි පර්චස් තිස්හතරයි දශම පහයි බිංදුවක් (අ. 2, රූ. 0, පර්. 34.50) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-1154/1

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/44/00252.

ණයකරුගේ සම්පූර්ණ නම : ඒකනායක මුදියන්සේලාගේ සිරිල් ඒකනායක සහ මානෙල් පරණ පල්ලියගුරුගේ.

නුවර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. එස්. ධනපාල විසින් ලියා සහතික කරන ලද අංක 749 හා 1997.11.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් හාරසිය විසිහතරයි ශත හැටඅටක (රු. 2,32,424.68) ක මුදලක් වර්ෂ 2002.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් තුන්සිය අසූවයි ශත හතරක (රු. 1,81,380.04) මුදල ද වර්ෂ 2002.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්එක්දහස් හතළිස්හතරයි ශත හැටහතරක් (රු. 51,044.64) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් හාරසිය විසිහතරයි ශත හැටඅටක් (රු. 2,32,424.68) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඑක්දහස් තුන්සිය අසූවයි ශත හතරක (රු. 1,81,380.04) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොළියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනගර සභා සීමාව තුළ වටපුළුවේ බෝමළුවේ, දෙවට පාරේ අංක 21හි පිහිටි හුන්කිරිගේ කුඹුරේවත්ත ඉඩමට 1996.03.14 දින එච්. එච්. එම්. ටී. ආර්. විජේරත්න මානක විසින් සාදන ලද අංක 1997ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1බී හි ඊසාන දිගට : දංදෙනියේහේන සහ කැබලි අංක 1ඒ ද, ගිණිකොණට : කැබලි අංක 1ඒ සහ 1ඩී ද, නිරිතට : කැබලි අංක 1සී සහ දංදෙනියේහේන ද, වයඹට : දංදෙනියේහේන යන මායිම් තුළ පර්චස් විසිපහක් (අ. 0, රූ. 0, පර්. 25) විශාල ඉඩම එහි පිහිටි සියලු දේද, මාර්ග පරවශතාවය ද සමඟ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 289/88හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2002ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

09-1125

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බම්බලපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. එන්. සමරනායක විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ලියා සහතික කරන ලද්දා වූ 2006.09.20 දින දිනැති සහ අංක 1217 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හේවාවෙලන්ගොඩගේ ජානක පුෂ්ප කුමාර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ අසූපන්දහස් හැත්තෑහතරයි ශත හතළිස්එක (රු. 6,85,074.41)ක මුදලක් 2007.07.27 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් 6,85,074.41 මුදලට 2007.07.28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1217 දරන බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහනාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, අංක 305/306 දරන ග්‍රාමසේවා කොට්ඨාසයේ, කීනිගම සහ පිටුවල්ගොඩ පිහිටි දම්බුව ස්ටේට් නමින් හැඳින්වෙන ඉඩමට බලයලත් මානක නලින් හේරත් විසින් මැන සාදන ලද 2005 අප්‍රේල් 30 දිනැති අංක 2004/273ඒ දරන පිඹුරේ බෙදා වෙන් කර විස්තර කරන ලද ලොට් 1 දරන ඉඩම, උතුරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද, නැගෙනහිරට : ලොට් 179න් ද, දකුණට : ලොට් ඩී1න් ද, බටහිරට : ලොට් 2න් ද මායිම් වූ පර්චස් දහහතරයි දශම හත (අ. 0, රූ. 0, පර්. 14.7)ක් විශාල ඇති පිඹුරු අංක 2004/273ඒ දරන ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඊ 818/159 සහ ඊ 818/163 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් අංක 1217 දරන බැඳුම්කරයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1110/2

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කිරිඳිවැල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ලියන ලද්දා වූ ද, 2004 ජූනි මස 23 දිනැති අංක 4416 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නුවන් දුලීප් කුමාර කළුපහන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැත්තෑ තුන්දහස් එකසිය පනස් එකයි ශත හැට හත (රු. 3,73,151.67)ක මුදලක් 2007.04.25 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 3,73,151.67 මුදලට 2007.04.26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4416 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර ආර්. එස්. මහනාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභාවේ, හෙනරත්ගොඩ උප කාර්යාල සීමාව තුළ එම්බරාලුව පිහිටි "කෝන්ගහවත්ත" ඉඩමට බලයලත් මානක එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද 1996 නොවැම්බර් මස 20 වැනි දිනැති අංක 7335 සහ ලොට් 6 ලෙස නිරූපිත ඉඩමේ ගොඩනැගිලි සහ ඒ තුළ සියලු දේ සමග උතුරට : ලොට් 1 සහ 5 ද, නැගෙනහිරට : ලොට් 14 (අඩි 15 පළල පාර) ද, දකුණට : ලොට් 7 සහ බටහිරට : ඩී. ඒ. ජයසේනගේ ඉඩම සහ මෙකී මායිම් තුළ පර්චස් විසි පහයි දශම හතයි අට (අ. 0, රූ. 0, පර්. 25.78)ක් විශාලත්වය ඇති ඉඩම සහ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 746/163 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම වේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකානායක විසින් මැන සාදන ලද 2004 ජූනි මස 23 දිනැති උකස්කර අංක 4416 දරන දෙවන උපලේඛනයේ සඳහන් පරිදි මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1110/4

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හැටන් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

හැටන් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කරුණාරත්න විසින් සහතික කරන ලද්දා වූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2006 මාර්තු මස 29 දිනැති අංක 3302 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෂන්මුගම් පුබාලරාජා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්එක්ලක්ෂ දහහතරදහස් දෙසීය හැටපහයි ශත පනහ (රු. 5,114,265.50)ක මුදලක් 2007.07.20 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් 5,114,265.50 මුදලට 2007.07.21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3302 දරන බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර එන්. එච්. පී. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවි ධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රි සමාජවාදී ජනරජයේ, මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, දිඹුල කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටගල පිහිටි "වුඩ්ටෝන් ස්ටේට්" නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක් වන ඉඩමට බලයලත් මානක ආර්. කනගරත්නම් විසින් සාදන ලද 1998.09.27 දින හා අංක 7074 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 10 දරන ඉඩමේ කොටගල, කෙලින් වීදියේ, වරිපනම් අංක 115/5 දරන ගොඩනැගිලි සමග උතුරට : ලොට් අංක 9 සහ 39න් ද, නැගෙනහිරට : ලොට් අංක 39 සහ 11න් ද, දකුණට : ලොට් අංක 11 සහ සර්වේ ජනරාල් විසින් සාදන ලද 1974.09.03 දින දරන පිපිනු. 502 දරන පිඹුර ප්‍රකාර ලොට් 2 දරන කැබැල්ලේ ඉතිරි කොටසකින් ද, බටහිරට : පිපි නු. 502 දරන පිඹුර ප්‍රකාර ලොට් 2 දරන කැබැල්ලේ කොටසකින් ද සහ ලොට් 9න් ද මායිම් වූ පර්චස් බින්දුවයි පහයි දශම බින්දුවයි බින්දුව (අ. 0, රූ. 0. පර්. 05.00) විශාලැති ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 61 වෙළුමේ 227 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

09-1110/5

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හැටන් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

හැටන් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කරුණාරත්න විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2006 මාර්තු මස 29 දිනැති අංක 3304 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ෂන්මුගම් පුබාලරාජා සහ වසන්තා කුමාරි පුබාලරාජා *නොහොත්* සතාසිවම් ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දසලක්ෂ අසූහත්දහස් නමසිය හතළිස්නමයයි ශත විසිහත (රු. 10,87,949.27)ක මුදලක් 2007.07.20 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතු ඇති හෙයින් එකී රුපියල් 10,87,949.27 මුදලට 2007.07.21 වැනි දින සිට වි කිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3304 දරන බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකාර එන්. එච්. පී. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, දිඹුල කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය, ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටගල පිහිටි "වුඩ්ටෝන් ස්ටේට්" නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් කොටසක් වන ඉඩමට බලයලත් මානක ඉරන්දතිස්ස කොටබගේ විසින් සාදන ලද 2002.10.05 දින හා අංක 4272 (සර්වේ ජනරාල් විසින් සාදන ලද 1974.09.03 දින පි. පිඹුරේ නු. 502හි ලොට් 2 දරන කොටසින්) පිඹුර ප්‍රකාර ලොට් 1 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම ද, උතුරට : ටී. පී. 47316 සහ ඉහත සඳහන් පී පිඹුරු නු. 502හි ලොට් 2 දරන කැබැල්ලේ ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : ටී. පී. 47316 සහ ඉහත සඳහන් පී පිඹුරු නු. 502 හි ලොට් 2 දරන කැබැල්ලේ ඉතිරි කොටසින් ද, දකුණට : ඉහත සඳහන් නු. පිඹුරේ 502හි ලොට් 2 දරන කැබැල්ලේ ඉතිරි කොටසින් ද බටහිරට : පාරෙන් සහ පිඹුරු අංක පී පිඹුරු නු. 502හි ලොට් 2 දරන කැබැල්ලේ ඉතිරි කොටසින් ද මායිම් වූ පර්චස් බින්දුවයි අටයි දශම පහයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 08.50) *හෙවත්* හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි එකයි පහක් (හෙක්ටයාර් 0.0215) විශාලැති ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ දරන කොට්ඨාසයේ 29 වෙළුමේ 285 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්.

09-1110/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.